# නර්තනය - 6 ශ්‍රේණිය

(පළමු වාරය )



The National e-learning Portal for the General Education

**නර්තනය : 6 ශ්‍රේණිය**

**ඒකකය : කළගෙඩි කවි**

**ගායනා පැවරුම් අංකය : 11**






- ජන ජීවිතයේ දෛනික ක්‍රියාකාරකමක් ඇසුරු කරගත් ගායනා විශේෂයකි.
- විනෝදාස්වාදය උදෙසා නිර්මාණය වී ඇති කවි විශේෂයකි.
- ජලය ගෙන යන කාන්තාවන්ගේ සුන්දරත්වය මෙම කවි වලින් ඉදිරිපත් කරයි.
- මෙහිදී ඔවුන් කළය රැගෙන දියට යෑම, කළය රැගෙන දිය නෑම, උසුළු විසුළු කිරීම, ඔවුන්ගේ රූප ස්වභාවය, කාන්තා හැඩරුව ගැන විස්තර කෙරේ.
- කළයේ වටිනාකම, නිර්මාණය කර ගන්නා ආකාරය, සාමූහිකත්වය, අන්‍යෝන්‍ය සුහදත්වය මෙම කවි මගින් විස්තර කෙරේ.
- කළගෙඩි මාලය නැමැති පද්‍ය රචනාවෙන් උපුටාගත් කවි ගායනා කළගෙඩි කවිවල ඇත.

## කළ ගෙඩි කවි

1ග පේළි සැදී අඟනෝ සැරසීලා නීල
වරළ කුසුමන් ගවසාලා කෝල නොවී
සබ මැදට වැදීලා බාල ලියෝ කළ පිඹිති
සැදීලා

2ග ජලය සොඳයි බැසලා පීනන්නට විලය
සොඳයි මල් ගැබ මෝරන්නට මිලයටවත් කළ
දීලා ගන්නට
කළය සොඳයි මේ ළඳට පිඹින්නට

3ග ලක් පමණට මැටි ඉදිකරවා ගෙන පත්
බිඳලා කළගෙඩි සදවා ගෙන අත් නෑරම
කළගෙඩි තෝරා ගෙන
සිත් සතොසින් කළ පිඹිමු සැදී ගෙන

ක්‍රියාකාරකම

1ග කළගෙඩි කවි ගායනා වලින් විස්තර කෙරෙන කාන්තා ක්‍රියාකාරකම් මොනවාද?.
2ග කළගෙඩි කවි රචනා වීමට මුල් වූ ග්‍රන්ථය කුමක්ද?.
3ග නියමිත නාදමාලාවට කවි ගායනා කරන්න.


- උපදේශකත්වය - එස්. එම්. ඩී. ජී .සේනානායක (ස. අ .අ. නර්තන ක. අ. කා. හෝමාගම)
- ටී. එච්. ප්‍රියන්තා දමයන්ති මිය (බප/ හෝ/ බෝපේ රාජසිංහ මහා විද්‍යාලය)
- එම්. අයෝමා විමලවීර මිය (බප/ හෝ/ පාදුක්ක සිරි පියරතන ම.ම.වි.)
- ඩී.එස්. තරංගා දැරණියගල මිය (බප/ හෝ/ සුභාරතී මහාමාත්‍ය මහා විද්‍යාලය